# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,721 — 1966 නොවැම්බර් 10 වැනි බ්‍රහස්පතින්ද — 1966.11.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන | 807 | ආදායම හා වියදම පිළිබඳ ප්‍රකාශන | 815 |
| තනතුරු—ඇබෑර්තු | 808 | අය–වැය ලේඛන | 817 |
| විභාග, විභාග ප්‍රතිඵල් ආදිය | 811 | දේපළ විකිණීම | — |
| කුරු ව්‍යවස්ථා | — | මාර්ග සොම්වී දැන්වීම | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම | 814 | විවිධ දැන්වීම් | 820 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඕ.—බී. 3/65.

### මහා නගර සභා ආඥාපනත

#### ආඥාව

(252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 2, 5, 6 සහ 9 වැනි වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති මූරුගේසන් තිරුචෙල්වම් වන මම, මෙම ආඥාවෙන්, 1966 ඔක්තෝබර් 3 වැනි දින අංක 14,715/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ රත්නපුර මහ නගර සභාව සංස්ථාපනය කිරීමට අදාළ ආඥාවේ දෙවන උපලේඛනය එහි අංක 11 දරන කොටුව ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාවන් පිළිබඳ විස්තරයෙහි දැක්වෙන "බණ්ඩාරනායක මාවතේ මධ්‍ය රේඛාව දක්වා ඊශාන දෙසට අඳිනලද රේඛාවකින්ද" යන වචනවලට ඉක්බිතිව පහත සඳහන් විස්තරය එක් කිරීමෙන් සංශෝධනය කරමි:—

"එතැන් සිට පසුකී මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක ඇල්. 24/4/1 ඩබ්ලිව් දරන නගර මිනුම් පත්‍රයේ අංක 100 දරන බිම් කට්ටියේ නැගෙනහිර මායිම සමග එක එල්ලේ පිහිටි ලක්ෂ්‍යයක් දක්වා අඳින ලද රේඛාවක් දක්වා බටහිර දෙසට ද එතැන් සිට එකී නැගෙනහිර මායිමේ සහ දීර්ඝ කරන ලද මායිම ඔස්සේ හෙලින්ස් මාවතේ මධ්‍ය රේඛාව දක්වා උතුරට සහ එකී මධ්‍ය රේඛාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු මායිමේ ආරම්භක ස්ථානය හමුවන තෙක් ඊශාන දෙසට ද වේ."

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 නොවැම්බර් මස 3 වැනි දින,
කොළඹ දී ය.

11-448—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

#### 13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර (ඉහළ) නැගෙනහිර කොට්ඨාශයේ වැඩ බලන සහකාර කොමසාරිස් කනගනායගම් නල්ලෙයිනාතන් වන මම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පැණිකැටියාව ගම්සභාවේ අංක 1 කොටසේ නියෝජිත පූමනි නාගරත්නම් මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි වාරගණනකට තමන් තෝරා පත් කර ගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පැණිකැටියාව ගම්සභාවේ අංක 1 කොටසේ නියෝජිත පූමණි නාගරත්නම් මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනය සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

කේ. නල්ලෙයිනාතන්,
වැඩබලන සහකාර පළාත් පාලන කොමසාරිස්,
(ඉහළ) නැගෙනහිර කොට්ඨාශය.

පළාත් පාලන දෙපාර්තමේන්තුව,
(ඉහළ) නැගෙනහිර කොට්ඨාශය,
1966 නොවැම්බර් මස 1 වැනි දින,
ත්‍රිකුණාමලයේ දීය.

11-456/2—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජුලි මස 15 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදේසි.)

**සටහන.**—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරි" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය හට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට සූදානම්ව සිටිත්ද නැත්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි සත්‍ය නොවන අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඒම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

### ————තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදැහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ විහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දන්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—

සේනාංකය තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශෙෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශෙෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නැත් නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාතේ පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### ජල කර්මාන්ත පරීක්ෂක තනතුරු

පහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත් කැඳවයි.

2. වැටුප.—මෙම තනතුරට නියමිත වැටුප් පරිමාණය වර්ෂයකට රුපියල් 1,860—17 × 120 සහ 8 × 180—රු. 5,340 කි. මෙම වැටුප් පරිමාණයෙහි වර්ෂයකට රු. 3,420 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් ද, වර්ෂයකට රු. 4,800 ට පෙර කාර්යක්ෂමතා කඩයිමක් ද වේ.

3. පහත සඳහන් අයගෙන් පමණක් අයදුම්පත් භාරගනු ලැබේ :—

(අ) කොළඹ නාගරික සභාවේ ඉංජිනේරු ඕවර්සියර්වරුන් සහ

(ආ) කොළඹ නාගරික සභාවෙන් පිට ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි ජල කර්මාන්ත පරීක්ෂකවරුන්, කර්මාන්ත ඕවර්සියර්වරුන් සහ ජල කර්මාන්ත ඕවර්සියර්වරුන්.

අයදුම්කරුවනට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(i) සුත් අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්ද, යටත් පිරිසෙයින් එයින් අවුරුදු දෙකක් ජල කර්මාන්තය පිළිබඳව විය යුතුයි.

නැතහොත්

(ii) ජලකර්මාන්ත පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්ද.

අයදුම්කරුවනට පහත සඳහන් ශිල්පීය සුදුසුකම්වලින් ද එකක්වත් තිබිය යුතුයි :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය (සිවිල්);

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ නාගරික ඉංජිනේරු ශිල්පය (තුන් අවුරුදු සන්ධ්‍යා පාඨ මාලාව) පිළිබඳ අවසාන සහතිකය;

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨ මාලාව) පිළිබඳ අවසාන සහතිකය;

නැතහොත්

(ඈ) වෙනත් සමාන සුදුසුකම්.

4. තෝරාගන්නා ලද අයදුම්කරුවන්, කොළඹ නාගරික සභාවට පත්කරනු ලැබුවහොත්, කොළඹ නගරයේ සිට සැතපුම් 10 ක අර්ධ විෂ්කම්භය ඇතුළත පදිංචිවන ලෙස නියම කරනු ලබන අතර, ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් නියම කරනු ලබන පරිදි ඒ ඒ අවස්ථාවල ලබුගම හෝ කලටුවාවේ මූලස්ථානවල රාජකාරි ඉටු කිරීමට නියම කෙරේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, 1966.11.29 දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම් පත් භාරගනු ලැබූ අවසාන දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසුකම් ඇති ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966.11 මස 1 දින,
කොළඹ,
තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

11-528—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය
### සහකාර හෙදි පාලිකා තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. **තනතුරට නියමිත වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 2,460—120×9—රු. 3,540 ; මේ වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රු. 2,820 යන වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස : 1966.11.29 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි ;

(ආ) අයදුම්කරුවන්ට පොදු සාත්තු සේවිකා සහතිකය සහ ජන සෞඛ්‍ය සාත්තු සේවිකා සහතිකය හෝ කොළඹ නගර සභාවේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැන විසින් පවත්වනු ලබන දෙපාර්තමේන්තුමය විභාගය සමත්වීමෙන් පසු නිකුත් කරනු ලබන සහතිකය තිබිය යුතුය. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය).

4. තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට කොළඹ මහ නගර සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට පත්කරනු ලබන අතර, නගර සීමාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට 1966.11.29 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය. සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 9 වැනි කොටුව වෙනුවට පහත සඳහන් කරුණු යොදා ගතයුතුයි :—

"(අ) පුහුණු පොදු සෞඛ්‍ය සේවිකාවක්ද ?

(ආ) සාත්තු සේවය පිළිබඳ ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :———— ".

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා හෝ විසින් එම අයදුම් පත්, අවසාන දිනට ප්‍රථම ලැබුණ බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

————,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 26 දින,
තැ. පෙ. 530,
කොළඹ, පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

11-467—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය
### II වැනි ශ්‍රේණියේ පුහුණු වඩු තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වැටුප, වර්ෂයකට රුපියල් 750—13×42—1,296.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) 1966.11.29 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

(ආ) අයදුම්කරුවන් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ 7 වැනි පංතියෙන් සමත්වී සිටිය යුතුය. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

(ඇ) අයදුම්කරුවන්ට, ගෘහ නිර්මාණයට අදාළ වූ ගොඩනැගිලි පියසි, දොර, ජනෙල් යනාදිය සෑදීම හා අලුත්වැඩියා කිරීම පිළිබඳව අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.) සුදුසු අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය විය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966.11.29 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දිනට පෙර ලැබුණු බැව් සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම් පත් පමණක් ලැබුණු බැව් දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 26 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

11-469—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය
### පළාත් පාලන සේවයේ වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරු වරුන්ගේ ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1966

පළාත් පාලන සේවයේ වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරුවන්ගේ (විදුලිය) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගයක් පළාත් පාලන සේවයේ I හා II වැනි ශ්‍රේණීන්හි විදුලිය අධිකාරීන් සඳහා කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන්නේ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසිනි. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

2. **වැටුප් හා සේවා කොන්දේසි.**—(ඒ) සමත්වන අයදුම්කරුවෝ වර්ෂයකට රු. 5,160—9×360 සහ 1×480—රු. 8,880 යන වැටුප් ක්‍රමය හිමි පළාත් පාලන සේවයේ වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරු (විදුලිය) වරුන්ගේ ශ්‍රේණියේ තනතුරු වලට පත් කරනු ලැබේ. රජයේ ප්‍රමාණයන්ට හා නියමයන්ට අනුව ගෙවල් කුලී දීමනා, තාවකාලික ජීවන වියදම් දීමනා හා විශේෂ ජීවන වියදම් දීමනාද ගෙවනු ලැබේ.

(බී) සමත්වන අයදුම්කරුවන් පළාත් පාලන සේවා රෙගුලාසිවල අංක 22 (2) දරන රෙගුලාසිය අනුව වැඩ බැලීමේ පදනමක් මත පත් කරනු ලැබේ. ඔවුන් සිය තනතුරුවල ස්ථිර කිරීම වැඩ බැලීමේ කාලසීමාව අවසානයේදී සලකා බලනු ලැබේ. වැඩ බැලීමේ කාලසීමාව, ප්‍රථම අවස්ථාවේදී අවුරුද්දක කාලයකට සීමාවේ. ඔව්හු ලංකාවේ ඕනෑම ස්ථානයකට පත්කර යැවිය හැකිය. ඔව්හු පළාත් පාලන

සේවා ආඥාපනතට (264 පරිච්ඡේදය) සහ ඒ පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධනයන්ට සහ එම ආඥාපනත යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසිවලටද යටත් වෙති.

3. **සුදුසුකම්.**—1966 නොවැම්බර් මස 30 වැනි දිනට හෝ ඊට පෙර සිය තනතුරුවල ස්ථිර කොට ඇති පළමු වැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරීන් සහ දෙවැනි ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩයිම් විභාගය සමත් කොට ඇති දෙවැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරීන් මෙම විභාගයට ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

4. **අයදුම්පත්.**—(ඒ) විභාගයට ඇතුළත්වීමේ අයදුම්පත් මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙළ කොට, "සභාපති පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට එවිය යුතුයි.

(බී) අයදුම්පත් 1966 නොවැම්බර් මස 30 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(සී) අයදුම්කරුවන් සිය අයදුම්පත්, තමා දැනට සේවයේ නියුක්ත ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධාන තැනගේ මාර්ගයෙන් එවිය යුතුයි. මෙසේ කිරීමට යම් අපේක්ෂකයකු අපොහොසත් වුවහොත්, ඔහු නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

(ඩී) 1966 නොවැම්බර් මස 30 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන සේ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා වෙත සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

5. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) පිළිගනු ලැබූ අයදුම් පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ, ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

(ii) අයදුම්කරුවන් තමාට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුයි. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(iii) ප්‍රවේශ පත්‍රයක් සමඟ කාල සටහන් පිටපතක් ද අයදුම්කරුවන්ට එවනු ලැබේ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයේ දී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි.

(iv) විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කටවත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව වහාම "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට දැනුම් දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතුයි :—

(i) විභාගයේ නම :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(iii) සම්පූර්ණ ලිපිනය :————.

6. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පිළිවන.

7. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති විසින් පිළිගනු ලැබූ අයදුම් පත් හිමි, ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස, ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

8. **හඳුනා ගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) තැපැල් පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක් ;

(බී) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3ක කාලසීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක් ;

(සී) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3ක කාලසීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක් ;

(ඩී) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයෙකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසුපිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක් :—

පසුපිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ..........................යන අයගේ බව මම සහතික කරමි.
(අයදුම්කරුගේ නම)

————,
(අයදුම්කරුගේ අත්සන)

————,
(අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන)

නම හා තරාතිරම :—..................................

ලිපිනය :— ..........................................

විභාග ශාලාවේදී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

9. **විභාග පරිපාටිය :**—විභාගය සඳහා නියමිත විෂයයන් පහත දැක්වේ :—

| | ලකුණු |
|---|---|
| I. **දෙපාර්තමේන්තු සංවිධානය සහ මුදල් කටයුතු** ... | 100 |

ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි විදුලිය දෙපාර්තමේන්තුවේ මුදල් සැලැස්ම හා කළ හැකි වැඩි දියුණු කිරීම්, වියපැහැදම් පාලනය හා අරපිරිමැස්ම සහ ව්‍යාපාරික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමෙහි ලා ගතහැකි පියවර. කාර්මික භාරය වැඩි කිරීමේ මාර්ග හා දෙපාර්තමේන්තු ජනක ධාරිතාව වර්ධනය කිරීමේ ක්‍රම. ලිපි ගනුදෙනුව හා විමධ්‍යකරණය පිළිබඳ ක්‍රියා මාර්ගය, ගණන් තැබීමේ ක්‍රමය, මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසි. කාර්මික හා ලිපිකරු කාර්ය මණ්ඩල. යටත් කාර්මික සේවා නිලධාරීන්ගේ, කාර්මික සහකාරයින්ගේ සහ විදුලිය අධිකාරීන්ගේ වැටුප්, ගමන්, යැපීම් දීමනා, නිවාඩු, නිවාඩු කාල නිදහස් දුම්රිය ප්‍රවේශ පත්‍ර ආදිය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, අර්ධ ආණ්ඩු දෙපාර්තමේන්තු හා පෞද්ගලික පාර්ශ්වයන් සඳහා වැඩ පිළිබඳ ක්‍රියා මාර්ගය. වෙනස් වෙනස් මාර්ගවල කොන්ත්‍රාත්තු සහ අනුගමනය කෙරෙන ක්‍රියා මාර්ගය. ඇස්තමේන්තු පිළියෙල කිරීම සහ ගණන් තැබීම සඳහා කාර්යාලවල තබාගන්නා වෙනස් වෙනස් ගිණුම් පොත්. කම්මාන්ත ශාලාවේ සහ ගබඩාවේ මුදල් සැලැස්ම හා සංවිධානය විචාරාත්මකව සලකා බැලීම ; ගබඩා ආරක්ෂාව, පරීක්ෂාව හා පිරික්සීම. ඉන්ඩෙන්ටු සහ මෙරට ටෙන්ඩර් පිළිබඳ ක්‍රියා මාර්ගය හා ඒ ක්‍රියා මාර්ගය විචාරාත්මකව සලකා බැලීම. කර්මාන්ත ශාලා බඩු සහ ගණන් තැබීම.

| | |
|---|---|
| II. **බල මධ්‍යස්ථාන ව්‍යවහාරය** ... ... | 100 |

යාන්ත්‍රික හා විදුලිය ඉංජිනේරු ශිල්පය පිළිබඳ ප්‍රශ්න පිළියෙල කරනු ලැබේ. ප්‍රායෝගික වශයෙන් ගැටලුවලට මුහුණ දෙන ආකාරය අතින් අපේක්ෂකයකු ලබා ඇති සමත්කම් නිශ්චය කිරීම සඳහා අංකමය ගැටලු ද අඩංගු වේ.

බල යන්ත්‍රාගාර අලුතින් පිහිටුවීම (සිසිල් කරන ක්‍රමය හා සහායකයන් ද ඇතුළුව) මූලික කරුණු, විශේෂ විස්තර අත්හදා බැලීම් හා වැඩෙහි යෙදවීම. එදිනෙදා නඩත්තුව, අලුත් බල යන්ත්‍රාගාරවල සුළු අලුත්වැඩියා, පැරණි යන්ත්‍රාගාරවල විශාල අලුත්වැඩියාවන් හා මුළුමනින් සැකසීම, පැරණි යන්ත්‍රාගාර පවත්වාගෙන යාමේ හා ඉවත් කිරීමේ ආර්ථික න්‍යායයන්.

ඩීසල් සහ පැට්‍රෝල් ඇන්ජින් පිළිබඳ මූලධර්ම, ප්‍රධාන සංචලක හා විදුලි යන්ත්‍ර ක්‍රියා කරවීමේ විවිධ පාඩු සහ කාර්යක්ෂමතාවන්. ධාවන වියදම් සහ කාර්ය මණ්ඩල අවශ්‍යතා සහ කාර්ය මණ්ඩල ප්‍රයෝජනයට ගැනීම. නගර සම්පාදන ක්‍රමයන්ගේ කාර්යක්ෂමතා හා ආර්ථික ක්‍රියාකාරිත්වය සඳහා ඉන්ධන හා අමතර කොටස් පිළිබඳ අවශ්‍යතා.

විවෘත හා සංවෘත සිසිල් කිරීමේ ක්‍රම, උෂ්ණත්ව හා පීඩන ව්‍යාප්තීන්, ජල පවිත්‍ර කිරීමේ මූලික ස්වරූප සහ ජලය සිසිල් කිරීමේ රසායනික උපක්‍රම. ස්නේහක ක්‍රම හා ඒවා පෙරීම ; ස්නේහනයේ මූලික අදහස්. අවශක්මතා සරල ධාරා සහ ප්‍රත්‍යාවර්තක ධාරා ජනක සහ උද්දීපකයන්. විදුලි යන්ත්‍ර වර්ග සහ එතීම, පරිමන්දනය හා අමේවර ප්‍රතික්‍රියාව පිළිබඳ මූලික දැනුමක්.

විදුලිය හා යාන්ත්‍රික යන්ත්‍රාගාරවල ශීඝ්‍රතාව සකස් කිරීම, භාරයක වොට් සහිත හා වොට් රහිත අවයව බල සාධකය සහ දෛනික රූප සටහන් පිළිබඳ සරල ගැටලු.

යතුරු ගියර්, වායු සහ තෙල් පරිපථ භෙදක, ජනකවල ප්‍රතියෝජක හා ආරක්ෂාව. විදුලිය පරිමාණ මැනීම පිළිබඳ මූලික දැනුමක්, සාමාන්‍ය බලස්ථාන ව්‍යවහාරයේ දී යොදා ගත හැකි උපකරණ ඒකීකරණය හා සංඥකරණය.

ලෙඩ් ඇසිඩ් බැටරි නඩත්තුව හා භාවිතය, බල යන්ත්‍රාගාරය ධාවනය කිරීමේදී අවශ්‍ය වන ආරක්ෂක රෙගුලාසි හා ආරක්ෂා විධිවිධාන.

ලකුණු

### III. විදුලිය යෝජනා ක්‍රම ... ... 100

ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි ක්‍රියා මාර්ගය—නාගරික විදුලිය යෝජනා ක්‍රමයක් සඳහා මූලික විමර්ශනය—ඒ ගැන ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආණ්ඩුවේ විදුලිය දෙපාර්තමේන්තුවෙන් තොග වශයෙන් සම්පාදනය ගැන හෝ ස්වීය ජනන මධ්‍යස්ථාන ඇතිවීම ගැන විශේෂ සැළකිල්ල ඇතිව, එවැනි යෝජනා ක්‍රමවල ආර්ථික ස්වරූපයන් කෙරෙහි බලපාන සාධකයන්—ටෙන්ඩර් කැඳවීමට පළමු එවැනි යෝජනා ක්‍රමවල විශේෂ විස්තර හා පරිමාණ පත්‍ර පිළියෙල කිරීම. නාගරික විදුලිය යෝජනා ක්‍රමයන්හී සාපේක්ෂ වියදම් හා සම්පාදන සංඛ්‍යා ලේඛන. නාගරික විදුලිය යෝජනා ක්‍රමයන් සඳහා ණය ලබා ගැනීමේ අයදුම්පත් පිළිබඳ ක්‍රියා මාර්ගය.

කුඩා බල මධ්‍යස්ථානවල සැලැස්ම හා අවශක්මතා ව්‍යාප්තී ක්‍රම—මුදුන් ව්‍යාප්ති ක්‍රම සඳහා සුදුසු කනු තෝරා ගැනීම සහ පිරික්සීම, පරීක්ෂණ පිළිබඳ ක්‍රියා මාර්ගය සහ නඩත්තු වැඩ හා ව්‍යාප්ති ක්‍රමයන් දියුණු කිරීම පිළිබඳ වාර්තා.

නගරවල විදුලිය යෝජනා ක්‍රමයන්හි මුහුණපෑමට සිදුවන ගැටලු. ප්‍රාදේශීය විදුලිය යෝජනා ක්‍රමයන්හි ගාස්තු සටහන්.

නගරසභා සුළුනගර සභා හා ගම් සභාවන්හි විදුලිය දෙපාර්තමේන්තුව සඳහා කාර්මික හා ලිපිකරු නිලධාරි මණ්ඩලයේ සාමාන්‍ය සැකැස්ම හා සංවිධානය. විදුලිය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සමග ඇති සම්බන්ධය. ප්‍රාදේශීය බල මණ්ඩල හා ආණ්ඩුවේ විදුලිය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවත් සමග ඇති වර්තමාන සම්බන්ධය සලකා බැලීම හා අනාගත සංවර්ධනය දෙසට ඇති විය හැකි නැඹුරුවීම්. ආණ්ඩුවේ විදුලි කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අතිරේක අතිශක්මතා පද්ධතිය, ප්‍රාදේශීය බල මණ්ඩල යෝජනා ක්‍රමයන්හි වර්ධනය හා සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය සලකා බැලීම.

ගෘහ කර්මාන්ත සංවර්ධනය සඳහා ග්‍රාමීය ප්‍රදේශ විදුලිවත් කිරීම.

විදුලිමය ගෘහෝපකරණ ජනප්‍රිය කිරීම හා ඒවා මිලයට ගැනීමේ පහසුකම්. දෛනික භාරය සංවර්ධනය. ලංකා විදුලි සම්පාදන කර්මාන්තය හා අනාගතය. ලංකා ආර්ථික සංවර්ධනයෙහි ඊට හිමි තැන.

**වැදගත්.**—1950 අංක 19 දරණ විදුලි ආඥාපනත හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසි.

### IV. ගොඩනැගිලිවල විදුලිය ස්ථාපනය ... 100

ගොඩනැගිලිවල විදුලිය සම්පාදන ද්‍රව්‍ය සඳහා විදුලිය ඉංජිනේරු විද්‍යායතනයේ රෙගුලාසි—ආලෝකනය හා බලය සඳහා කම්බි දැමීම හා ගොඩනැගිලිවල නඩත්තු—දැව ආවරණය සහ කොපු ගනකළ පරිවරණය හා සන්නයනය කම්බි පථ ක්‍රමය කෙරෙහි විශේෂ සැළකිල්ල සහිතව කම්බි පථ ක්‍රමය—කම්බි පථ රූප සටහන්—විශාල සහ කුඩා විදුලිය ස්ථානයන් සඳහා පරිමාණ ගැනීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම—පාඨශාලා, කර්මාන්තශාලා, කාර්යාල, විශාල තට්ටු නිවාස, නාට්‍යශාලා, සිනමා හල්, ආරෝග්‍ය ශාලා කම්බි දැමීම—පංකා හා සීනු පරිපථ, ස්විකිරීම—දෙමං පරිපථ, දෙමං සහ අන්තර පරිපථ. තහඩු දෙකේ සහ තහඩු තුනේ සීලිං රෝසස් භාවිතය—ගොඩනැගිලිවල සැපයුම් පාලනය හා බෙදා හැරීම. අතිශක්මතා හා අවශක්මතා කේබල් පිරිද්දීමේදී යොදා ගන්නා ක්‍රම සහ ද්‍රව්‍ය. විශාල විදුලිමය මුළුතැන් ගෙවල් සඳහා උදුන් සහ අනිකුත් විදුලිය සම්පාදන ද්‍රව්‍ය සඳහා කම්බි යෙදීම. "සමස්ත විද්‍යුත් අගාරය" සහ එවැනි ස්ථාපනයන්ට ගැලපෙන වර්තමාන කම්බි පථ ක්‍රමයන් සඳහා අවශ්‍ය වැඩි දියුණු කිරීම්—ලොකු කුඩා මෝටර් යන්ත්‍ර ස්ථාපනය, අත්හදා බැලීම හා ඒවායේ නඩත්තුව. මෝටර් ක්‍රියා කරවීමේ සම්පාදන ද්‍රව්‍ය. පොම්ප සහ ගෘහෝපකරණ සම්පාදනය හා අත්හදා බැලීම සහ ඒවායේ නඩත්තුව, පාවිච්චියේ ඇති ලාම්පුවල වර්ග හා නිෂ්පාදනයන් සහ ඒවායේ ආරෝහණ ප්‍රමාණයන් හා අන්තරයන්.

ලෝහ සූත්‍රිකා ලාම්පු සහ වායු විසර්ජන ලාම්පු. ප්‍රතිදීප්ත ආලෝකනය, ඒවා සම්බන්ධි කොටස් හා සම්බන්ධ කිරීම. ප්‍රතිදීප්ත පහන්වල ඇතිවන වැරදි හා ඒවා නිවැරදි කිරීම.

සීයයේ කිලෝ වෝල්ට් ඇම්පියර් ධාරිතාවක් දක්වා කාර්මික ස්ථාපනයන් කම්බි යෙදීම හා අත්හදා බැලීම. ඇස්තමේන්තු තැනීම. කාර්මික ස්ථාපනයන් අත්හදා බැලීම සහ නඩත්තුව. සතුටුදායක බලසාධකය හා වෝල්ටීයතාව අත්හදා බැලීම. කුඩා හා විශාල ස්ථාපනයන්ට සේවා සම්බන්ධ කිරීම—ඇස්තමේන්තු පිළියෙල කිරීම—මුදුන් හා බිම් යට සේවා සම්බන්ධ කිරීම—විශාල කාර්මික විදුලිය ස්ථාපනයන්ට සේවා සම්බන්ධ කිරීම—අවශක්මතා උප පෝෂක පනෝල—සැපයුම් බෙදා හැරීමේ පුවරු—අවසාන උප පරිපථ—අධික ධාරාවන්ගෙන් ආරක්ෂාවීමේ ක්‍රම—පරිපථයන්ට වන මළ බැඳීම, කාන්දුවීම් හා යාන්ත්‍රික අලාභ හානි හා ඒවායින් ආරක්ෂා කිරීම, කාන්දු වාරක සවි කිරීම—විදුලිය ස්ථාපනයන් අත්හදා බැලීම, විදුලිය යන්ත්‍රවල දෝෂ සොයා ගැනීමට පිරික්සීම, වැරදි තැන් නිශ්චය කිරීම හා ඒවා නිවැරදි කිරීම.

විදුලිය සඳහා ස්ථාපනයක් සකස් කිරීමේදී විපථ සාධකය භාවිතය සහ ගොඩනැගිලිවල විදුලිය සම්පාදන ද්‍රව්‍ය පිළිබඳ රෙගුලාසි යටතේ අවසාන උප පරිපථයකට විපථ සාධකය යොදා ගනු ලබන්නේ කවර තත්ත්වයන් යටතේ ද යන්න.

වීථි ආලෝකනයේ ක්‍රම සම්පාදනය, සවි කිරීම හා නඩත්තුව—භාවිතයේ ඇති ලාම්පු වර්ග—වර්තමාන ක්‍රමයන් වැඩි දියුණු කිරීම.

කුඩා හා විශාල ගොඩනැගිලි සඳහා වායු සමීකරණ උපකරණ සහ ඒවා නඩත්තු කිරීම—විදුලි සෝපාන අත්හදා බැලීම හා නඩත්තු කිරීම සහ ඒවා ධාවනය කිරීමේ මූල ධර්ම.

කුඩා හා විශාල ස්ථාපනයන් හා විදුලිය යන්ත්‍ර භූගත කිරීමේ ක්‍රම.

### V. සම්ප්‍රේෂණය හා බෙදා හැරීම ... ... 100

**සාමාන්‍ය.**—සැපයුම් ක්‍රම, මුදුන් මාර්ග, බිම් යට කේබල්, පෝෂක, බෙදා හරින්නෝ, ප්‍රධාන සේවා මාර්ග, පරිනාමක යෝ. යතුරු ගියර, ආරක්ෂාව හා මීටර යෙදීම.

මුදුන් මාර්ග :—(අව ශක්මතා, එච්. අයි. සහ අති ශක්මතා).

**රෙගුලාසි.**—සන්නායකයෝ—සන්නායක ද්‍රව්‍ය—තඹ, ඇලුමිනියම්, වානේ කම්බි ඇලුමිනියම්, ගැල්වනයිස් වානේ ආදිය, කනු දැව, වානේ නළ, ලැටිස් වානේ, ශක්ති වර්ධිත කොන්ක්‍රීට් කණු, රේගල පොදු, ලැටිස් වානේ ස්තම්භ, දැව කණු ආරක්ෂා කර ගැනීම හා රසායන ප්‍රතිකර්ම, වානේ වැඩ පින්තාරු කිරීම හා ගැල්වනයිස් කිරීම. අන්තර ආධාරක, අංශක ආධාරක හා අග්‍ර ආධාරක සඳහා හරස් පොලු. රැඳවුම් සහ රැඳවුම් පිළිවෙල, රැඳවුම් කම්බි, රැඳවුම් පොලු, රැඳවුම් තහඩු, පරිවාරක කවු, සැකිලි පරිවාරක, කැප් පරිවාරක, පින් වර්ගයේ පරිවාරක, රැඳවුම් පරිවාරක සන්නායක, මූට්ටු සහ කලම්ප. ස්පන්දක පරිමන්දකයෝ; සන්නායකයන් අතර ඉඩ තැබීම හා පිළිවෙල වෙනස් කිරීම හා භූමියෙන් ඈත් කිරීම. පලිස් ආකාර බිම් කම්බි සහ භූමික බද්ධ සන්නායකයෝ භූගත කිරීම, දුර කථන දුම්රිය මං හා මහමං හරහා බල මාර්ග දැමීම.

බිම යට කේබල් (අව ශක්මතා, අති ශක්මතා සහ අතිරේක අති ශක්මතා).

කේබල් වර්ග, කේබල් දැමීම, පිරිද්දීම, පරිවාරක වර්ග හා සංයෝග කේබල් ධාරිකා බලයේ පරිවාරක ප්‍රතිරෝදය සහ කේබල් ප්‍රේරණය, කේබල් තාප ශීඝ්‍ර කරණය, කේබල් වල දෝෂ සොයා ගැනීම.

සම්ප්‍රේෂණය හා ගණන් බැලීම—ප්‍රතිරෝදය, තනි කලා හා තුන් කලා කේබල්වල හා කම්බිවල ධාරිකා බලය සහ බලා රෝහණය.

කම්බි, කේබල් පෝෂක හා බෙදා හරින්නන් විධිමත් පාලනය හා වෝල්ටීයතාව හීනවීම. මුදුන් කම්බිවල හා බිම් යට කේබල්වල පිරි එන ධාරා ; බල සාධකය හා බල සාධකය නිවැරදි කිරීම, වෝල්ටීයතාව පාලනය හා විධිමත් කිරීමේ උපකරණ. ලඝු පරිපථ ධාරා. මුදුන් කම්බි සඳහා සරල ආධාරකයන්ගේ ශක්තිය. සන්නායකයන්ගේ එල්ලා වැටුම් හා ආතතිය. උදාසීන ධාරා හා භූගත කිරීම.

යතුරු ගියර ආරක්ෂාව හා මීටර කිරීම.

පරිපථ භේදකයන්ගේ, විභාජකයන්ගේ හා සේව නූල්වල ශීඝ්‍රතාව සකස් කිරීම. ප්‍රතියෝජක ධාරා සහ දියුණු කළ හැකි පරිමාණක, පරිමාණක, විදුලි මාර්ග, කේබල් පෝෂක හා බෙදා හරින්නන්ගේ ආරක්ෂාව, ආලෝකනය හා ආරක්ෂාව, අති ශක්මතා, අව ශක්මතා සහ අතිරේක අති ශක්මතා සැපයුම්වල මීටර යෙදීමේ ව්‍යවහාරය.

අත්හදා බැලීම.

බිම් යට කේබල්, මුදුන් මාර්ග, පරිමාණක සහ යතුරු ගියර, කණුවල යාන්ත්‍රික ශක්තිය.

නඩත්තුව.

මුදුන් මාර්ග, බිම් යට කේබල්, පරිමාණක සහ උප මධ්‍යස්ථාන උප කරණ.

ඇස්තමේන්තු තැනීම.

මුදුන් මාර්ග සහ බිම් යට කේබල්වල (අව ශක්මතා, අති ශක්මතා සහ අතිරේක අති ශක්මතා) ලඝු දීර්ඝතා.

පෝෂක, ව්‍යාප්තික හා උප මධ්‍යස්ථාන උප කරණ.

විශේෂ විස්තර.

අව ශක්මතා, අති ශක්මතා සහ අතිරේක අති ශක්මතා උප මධ්‍යස්ථාන සඳහා මුදුන් මාර්ග ද්‍රව්‍ය සහ බිම් යට කේබල් පරිමාණක හා යතුරු ගියර.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

තැ. පෙ. 530,
කොළඹ, 1966 ඔක්තෝබර් මස 30 දින.

## පළාත් පාලන සේවය

**වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරුවන්ගේ (විදුලිය) ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය—1966**

(1966.11.10 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කර ඇති දැන්වීම බලන්න).

### විභාගයට ඇතුළත් වීමේ අයදුම්පත

**සැ. යු. :**—මෙම ආකෘති පත්‍රය අපේක්ෂකයාගේ අත් අකුරින් නිවැරදිවද, පැහැදිළිවද පුරවා 1966 නොවැම්බර් මස 30 වැනි දිනට හෝ ඊට පෙර හෝ "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති, තැ. පෙ. 530, කොළඹ," යන ලිපිනයට ලැබෙන සේ, අපේක්ෂකයා දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධාන තුමා මගින් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

1. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
2. අපේක්ෂකයා දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :————.
3. දැනට දරන තනතුර :————.
4. දැනට දරන තනතුරට පත්වීම ලද දිනය :————.
5. I වැනි ශ්‍රේණියේ විදුලි අධිකාරි තනතුරේ සපිරකර සිටිද : ————.
6. අයදුම්කරු II වැනි ශ්‍රේණියේ විදුලි අධිකාරි තනතුරක් දරන්නේද, එසේ නම් කාර්යක්ෂමතා කඩයිම් විභාගය සමත් කොට තිබේද :————.
7. පහත සඳහන් විෂයයන්ගෙන් ඔබ පෙනී සිටීමට අදහස් කරන විෂයයන් සඳහන් කරන්න (ඔව්, නැත යනුවෙන්) :————
   (i) දෙපාර්තමේන්තු සංවිධානය හා මුදල් :————.
   (ii) බලමධ්‍යස්ථාන ව්‍යවහාරය :————.
   (iii) විදුලි යෝජනා ක්‍රම :————.
   (iv) ගොඩනැගිලිවල විදුලිය ස්ථාපනය :————.
   (v) සම්ප්‍රේෂණය හා බෙදා හැරීම :————.
8. ඔබ මීට පෙර මෙම විභාගයට පෙනී සිටියේද ? එසේ නම් සමත් විෂයයන් හා අවුරුද්ද සඳහන් කරන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපතිතුමා වෙත.

මෙම ප්‍රාදේශීය බල මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ නියුක්ත ඉහත සඳහන් අපේක්ෂකයා........................................ වැනි දින සිට පළාත් පාලන විදුලිය අධිකාරීන්ගේ සේවයේ...............වැනි ශ්‍රේණියේ සිටින බවත්, ඔහුගේ වැඩ සහ හැසිරීම සෑම විටම සතුටු දායකව පැවති බවත් මෙයින් සහතික කරමි. ඔහු විසින් ඔහුගේ අයදුම් පතේ සඳහන් කොට ඇති විස්තර නිවැරදි වේ.

————,
නාගරික කොමසාරිස් / සභාපතිතුමා,
ප්‍රාදේශීය බලමණ්ඩලය.......

දිනය :————.

11–459—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

# පළාත් පාලන සහා ඡන්ද ආඥපණත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි අධිකාරය) 66(2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපෙක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇප්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩලය).

1966 ඔක්තෝබර් 26 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| කොට්ඨාශ අංකය | අපෙක්ෂකයාගේ නම |
|---|---|
| **මහනුවර දිස්ත්‍රික්කය** | |
| **පාතදුම්බර උඩගම්පහ ගම් සභාව** | |
| 4 | ඇස්. ඇම්. ගුණරත්න |
| **මාතර දිස්ත්‍රික්කය** | |
| **මාලිම්බඩ ගම් සභාව** | |
| 7 | සෝමදාස පතිරත්න |
| **අම්පාර දිස්ත්‍රික්කය** | |
| **නින්දවූර් ගම් සභාව** | |
| 1 | අලියාර් ලෙබ්බේ මොහමඩ් අමීර් අලි |

11–471—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බල මණ්ඩල).

1966 ඔක්තෝබර 26 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| **මහනුවර දිස්ත්‍රික්කය** | | |
| **උඩපළාත ගඟපහල ගම් සභාව** | | |
| 3 | ... | එඩ්වින් බර්නාඩ් චන්ද්‍රදාස |
| **උඩදුම්බර ගම්පහ බටඅිර ගම්සභාව** | | |
| 10 | ... | ජයසිංහ මුදියන්සේලාගේ උඩවලව්වේ ලොකු බණ්ඩා |
| **යාපනය දිස්ත්‍රික්කය** | | |
| **තෙල්ලිප්පලයි ගම් සභාව** | | |
| 4 | ... | මුත්තාර් තඩුව්ලාන් |

11–470—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## කෙල්දෙණිය—සුළු නගර සභාව

### 1964 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත්— | | | |
| සාමාන්‍ය ... ... | 7,694 61 | | |
| විදුලි සේවා ඇප ... ... | 6,191 75 | | |
| විදුලි සේවා සම්බන්ධ කිරීමේ ගාස්තු... | 2,050 82 | | |
| | | 15,937 18 | |
| ආධාර මුදලින් ඉතිරි මුදල්— | | | |
| ක්‍රීඩා භූමිය සඳහා ... ... | 5,000 0 | | |
| පට්ටියලන්ද පාර සඳහා ... | 161 20 | | |
| කෝවිල්ගොඩ පාර සඳහා ... | 4 0 | | |
| මැදලයන්වත්ත පාර සඳහා ... | 85 20 | | |
| රිවර්ලේන් පාර සඳහා ... | 20 0 | | |
| පුස්තකාලය සඳහා ... | 2,600 16 | | |
| | | 7,870 56 | |
| | | | 23,807 74 |
| ණය මුදලින් ඉතිරි මුදල්— | | | |
| විදුලි යෝජනා ක්‍රමය සඳහා ... | 1,931 96 | | |
| කායඪාලීය ගොඩනැගිල්ල සඳහා ... | 75 76 | | |
| නිවාස යෝජනා ක්‍රමය සඳහා ... | 772 69 | | |
| වෙළඳ පොල සඳහා ... | 1 60 | | |
| | | | 2,782 01 |
| ක්ෂය ප්‍රමාණ සංචිතය ... ... ... | | | 2,000 0 |
| විවිධ ණය හිමියෝ ... ... ... | | | 15,136 30 |
| සාමාන්‍ය ගිණුම— | | | |
| 1963.12.31 වැනි දිනට අධිකතාවය... ... | | 18,028 80 | |
| 1964.12.31 වැනි දිනට ආදයම ... | 80,184 02 | | |
| 1964.12.31 වැනි දිනට වියදම ... | 77,808 34 | | |
| | | 2,375 68 | |
| 1964.12.31 වැනි දිනට සමුච්චිත අධිකතාවය ... ... | | | 20,404 48 |
| | | | 64,130 53 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අයවිය යුතු :— | | | |
| අත්තිකාරම් ... ... ... ... | | | 1,226 50 |
| ආදයම් එකතු කිරීම— | | | |
| දේපල බදු ගිණුම ... ... | | 3,596 46 | |
| ජල බදු ගිණුම ... ... ... | | 1,334 22 | |
| වැසිකිළි ගාස්තු ගිණුම ... ... | | 514 50 | |
| විදුලි ගාස්තු ගිණුම ... ... | | 5,121 67 | |
| කුලී එකතු කිරීමේ ගිණුම ... ... | | 96 82 | |
| පුද්ගලික ජලනල ගාස්තු ගිණුම ... ... | | 1,641 10 | |
| වරෙන්තු ගාස්තු ගිණුම ... ... | | 202 73 | |
| | | | 12,507 50 |
| විවිධ ණය ගැතියෝ ... ... ... | | | 8,883 22 |
| ස්ථිර තැන්පත්—ලංකා සේවිංස් බැංකුව ... ... | | | 10,539 63 |
| විදුලි අංශය— | | | |
| 1963.12.31 වැනි දිනට ඌණතාවය ... | | 3,298 51 | |
| 1964.12.31 වැනි දිනට මුළු ආදයම | 44,136 80 | | |
| 1964.12.31 වැනි දිනට මුළු වියදම | 42,184 59 | | |
| | | 1,952 21 | |
| 1964.12.31 වැනි දිනට සමුච්චිත ඌණතාවය ... ... ... | | | 1,346 30 |
| මුදල් පොතේ ඉතිරිය ... ... ... | | | 29,627 38 |
| | | | 64,130 53 |

තෙල්දෙණිය සුළු නගර සභාවේ සභාපති තැන්පත් ජයසිංහ වාසල මුදියන්සෙලාගේ විජේරත්න වන මම, ඉහත සඳහන් ප්‍රකාශය, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 දෙසැම්බර් 31 වැනි දිනට තෙල්දෙණිය සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ නිවැරැදිවූත් සත්‍යවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ජ. වා. මු. විජේරත්න,
සභාපති,
තෙල්දෙණිය සුළු නගර සභාව.

නිවැරැදි බවට සහතික කරමි.

ඉ. වි. ජයසූරිය,
සණික.

1966 සැප්තැම්බර් මස 26 දින මා ඉදිරිපිට සහතික කරණ ලදී.

පී. ඇම්. වැවේගම,
සාමාදන විනිශ්චයකාර.

## තෙල්දෙණිය සුළු නගර සභාව

### 1964 වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය

**ආදායම**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... | 46,897 65 | |
| බී.—මහා මාර්ග ... ... | 1,609 50 | |
| සී.—නගර සභා ගොඩනැඟිලි හා ඉඩම් ... | 1,892 04 | |
| ඩී.—සනීපාරක්ෂාව ... ... | 23,670 48 | |
| ඊ.—මහජන විනෝදය ... ... | 6,080 85 | |
| එෆ්.—සොහොන් බිම් ... ... | 12 0 | |
| ජී.—බල්ලන් ලියා පදිංචි කිරීම ... | 21 50 | |
| එච්.—කිරුම් හා මිනුම් ... ... | — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂා වීම ... | — | |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල ... | — | |
| | | 80,184 02 |
| වෙනත් ආදායම්— | | |
| 1. තැන්පත්... ... ... | 12,014 67 | |
| 2. අත්තිකාරම් ... ... | 3,565 50 | |
| 3. විවිධ ණය ... ... | 12,607 36 | |
| 4. විදුලි ගණන් ... ... | 44,136 80 | |
| | | 72,324 33 |
| 5. ආදායම් එකතු කිරීම ; | | |
| (අ) දේපල බදු ... ... | 12,721 12 | |
| (ආ) ජල බදු ... ... | 4,731 68 | |
| (ඇ) වැසිකිළි ගාස්තු ... ... | 606 0 | |
| (ඈ) කුලී ... ... ... | 11,210 26 | |
| (ඉ) ජල නල ගාස්තු ... ... | 2,572 90 | |
| (ඊ) වරෙන්තු ගාස්තු ... ... | 116 79 | |
| (උ) විදුලි ගාස්තු ... ... | 37,248 52 | |
| | | 69,207 27 |
| 6. විවිධ අය ගණන් ... ... | | 6,410 71 |
| 7. විදුලි අංශය—ක්ෂය ප්‍රමාණ සංචිතය ... | | 1,000 0 |
| ආදායම් එකතුව ... | | 2,29,126 33 |
| 1964.1.1 දිනට ඉතිරිය ... | | 13,656 28 |
| | | 2,42,782 61 |

**වියදම**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | 20,253 47 | |
| බී.—මහා මාර්ග ... ... | 8,152 57 | |
| සී.—නගර සභා ගොඩනැඟිලි හා ඉඩම් ... | 11,726 98 | |
| ඩී.—සනීපාරක්ෂාව ... ... | 35,891 30 | |
| ඊ.—මහජන විනෝදය ... ... | 363 50 | |
| එෆ්.—සොහොන් බිම් ... ... | — | |
| ජී.—බල්ලන් ලියා පදිංචි කිරීම ... | — | |
| එච්.—කිරුම් හා මිනුම් ... ... | — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂා වීම ... | 24 0 | |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල ... | 1,396 52 | |
| | | 77,808 34 |
| වෙනත් වියදම්— | | |
| 1. තැන්පත් ... ... | 10,555 03 | |
| 2. අත්තිකාරම් ... ... | 2,972 0 | |
| 3. විවිධ අය ... ... | 8,883 22 | |
| 4. විදුලි ගණන් ... ... | 42,184 59 | |
| | | 64,594 84 |
| 5. ආදායම් එකතු කිරීම : | | |
| (අ) දේපල බදු ... ... | 10,100 13 | |
| (ආ) ජල බදු ... ... | 3,755 74 | |
| (ඇ) වැසිකිළි ගාස්තු ... ... | 469 0 | |
| (ඈ) කුලී ... ... | 9,010 11 | |
| (ඉ) ජල නල ගාස්තු ... ... | 3,307 0 | |
| (ඊ) වරෙන්තු ගාස්තු ... ... | 145 04 | |
| (උ) විදුලි ගාස්තු ... ... | 37,228 10 | |
| | | 64,015 12 |
| 6. විවිධ ණය ගණන් ... ... | | 6,340 01 |
| 7. තැපැල් සේවිංස් බැංකු ගිණුම ... | | 396 92 |
| වියදම් එකතුව ... | | 2,13,155 23 |
| 1964.12.31 දිනට ඉතිරිය ... | | 29,627 38 |
| | | 2,42,782 61 |

තෙල්දෙණිය සුළු නගර සභාවේ සභාපති තැන්පත් ජයසිංහ වාසල මුදියන්සෙලාගේ විජේරත්න වන මම, ඉහත සඳහන් ප්‍රකාශය, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 වර්ෂයේ තෙල්දෙණිය සුළු නගර සභාවේ ආදායම් හා වියදම් පිළිබඳ නිවැරැදිවූත් සත්‍යවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ජ. වා. මු. විජේරත්න,
සභාපති,
තෙල්දෙණිය සුළු නගර සභාව.

නිවැරැදි බවට සහතික කරමි.

ඉ. වි. ජයසූරිය,
සභික.

1966 සැප්තැම්බර් මස 26 දින මා ඉදිරිපිට සහතික කරන ලදී.

පී. ඇම්. වැවේගම,
සමාදාන විනිශ්චයකාර තැන.

11–483—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## බලන්ගොඩ නගර සභාව

**1966 වර්ෂයේ දෙවෙනි පරිපූරක ලේඛනය**

| වැය ශීර්ෂ හෝ උප වැය ශීර්ෂ | රු. | ශ. | යෝජනා අංක හා දිනයන් |
|---|---|---|---|
| ඊ.—මහජන සනීපාරක්ෂාව— | | | |
| 1. සාමාන්‍ය | | | |
| ඒ.—පරීක්ෂකවරුන්ගේ හා වින්නඹුවන්ගේ වැටුප් ... ... ... | 1,720 | 0... | 1966.8.6 වෙනි දින යෝජනා අංක 11 |
| ඒ.—සාමාන්‍ය වියදම්— | | | |
| 1. නිලධාරි වැටුප් | | | |
| ඊ.—විශ්‍රාම වැටුප් ... ... ... ... | 514 | 40... | 1966.8.6 වෙනි දින යෝජනා අංක 13 |
| සී.—තානායම | | | |
| 3—දුවබඩු හා උපකරණ ... ... ... ... | 1,565 | 0... | 1966.8.6 වෙනි දින යෝජනා අංක 15 |
| ඒ.—සාමාන්‍ය වියදම් | | | |
| 2. කාර්‍ය මණ්ඩලීය වියදම් | | | |
| බී.—ගමන් ගාස්තු ... ... ... ... | 150 | 0... | 1966.9.3 වෙනි දින යෝජනා අංක 6 |
| ඇf්.—ලිපිද්‍රව්‍ය මුද්‍රණවැඩ ... ... ... ... | 2,000 | 0... | 1966.9.3 වෙනි දින යෝජනා අංක 6 |
| සී.—තානායම— | | | |
| 2—නඩත්තු කිරීම ... ... ... ... | 1,000 | 0... | 1966.9.3 වෙනි දින යෝජනා අංක 6 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව— | | | |
| 7. වෙළඳපොලවල් හා ගාල්— | | | |
| ඒ.—වේතන හා අතිරේක දීමනා ... ... ... ... | 500 | 0... | 1966.9.3 වෙනි දින යෝජනා අංක 6 |
| බී.—නඩත්තුව ... ... ... ... | 1,500 | 0... | 1966.9.3 වෙනි දින යෝජනා අංක 6 |
| එච්.—බල්ලන් ලියා පදිංචි කිරීම— | | | |
| 1.—බල්ලන් වඳ කිරීම ... ... ... ... | 350 | 0... | 1966.9.3 වෙනි දින යෝජනා අංක 6 |
| ජේ.—විදුලිබල කාර්‍යාංශය— | | | |
| 4. පාලනය සහ සාමාන්‍ය වියදම්— | | | |
| ඩී—අනියම් වියදම් ... ... ... ... | 1,000 | 0... | 1966.9.3 වෙනි දින යෝජනා අංක 6 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව— | | | |
| 7. වෙළඳපොලවල් හා ගාල් | | | |
| ඩී—ඉදි කිරීම ... ... ... ... | 6,000 | 0... | 1966.9.3 වෙනි දින යෝජනා අංක 7 |
| | 16,299 | 40 | |

ඇම්. ඇල්. ඇම්. අබුසාලි,
සභාපති.

බලන්ගොඩ නගර සභාව,
1966 ඔක්තෝබර් 26.
11–472—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

## දඹුල්ල සුළු නගර සභාව

**1966 වර්ෂයේ අංක 2 දරණ පරිපූරක අය වැය ලේඛනය**

| වැය ශීර්ෂයෝ | යෝජිත වැය රු. | ශ. | එකතුව රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ—සාමාන්‍ය වියදම්— | | | | |
| 1. නිලධාරි වැටුප් | | | | |
| (බී) ලිපිකරුවන් ... ... | 385 | 0 | | |
| (ජී) ජීවනාධාර ... ... | 750 | 0 | | |
| 2. සංස්ථා වියදම්— | | | | |
| (ඒ) දීමනා අන් අන්දමකින් වෙන් නොකළ | 100 | 0 | | |
| (බී) ගමන් ගාස්තු ... ... | 200 | 0 | | |
| (ඩී) තක්සේරු කරන්නන්ගේ ගාස්තු ... | 213 | 0 | | |
| (ඊ) නීති උපදේශක ගාස්තු ... | 200 | 0 | | |
| (ඇප්) ලිපිද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රකාශණ සහ මුද්දර | 400 | 0 | | |
| (ජේ) හදිසි වියදම් ... ... | 150 | 0 | | |
| | | | 2,398 | 0 |
| සී. නගරසභා ඉඩම් සහ ගොඩනැගිලි— | | | | |
| (1) වැටුප් ... ... ... | 160 | 0 | 160 | 0 |
| ඩී. මහජන සෞඛ්‍ය— | | | | |
| 2. කැලිකසල ශෝධනය— | | | | |
| (ඒ) දෛනික වැටුප් ... ... | 450 | 0 | | |
| 5. ජල සම්පාදනය— | | | | |
| (බී) උපකරණ ... ... | 800 | 0 | | |
| (ඊ) ඉදි කිරීම ... ... | 1,000 | 0 | | |
| | | | 2,250 | 0 |
| | | | 4,808 | 0 |

1966ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දින පැවැත්වූ දඹුල්ල සුළු නගර සභාවේ රැස්වීමේ අංක 3 දරණ සම්මුතියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයන්ට යටත්ව මෙම පරිපූරක අය වැය ලේඛනය පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

වී. ජී. උක්කුරාල,
සභාපති.

සුළු නගර සභා කාර්‍යාලය,
දඹුල්ල, 1966 සැප්තැම්බර් මස 27 වැනි දින,

සංශෝධිත පරිදි අනුමත කරමි.

ඩී. අලුවිහාරේ,
සහකාර පලාත් පාලන කොමසාරිස්–මාතලේ.

1966.10.17

11–480—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

## ලුණුගල සුළු නගර සභාව

**අංක 40(II) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ ඉල්ලුම් පත්‍රයයි**

1966 වර්ෂයේ අය වැය ලේඛනයේ ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් අධික වියදම් වන වැය ශීර්ෂයන්ට මෙහි පහත පෙන්වන පරිදි මුදල් මාරු කිරීමට 1966ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ අංක 6 දරණ යෝජනාවෙන් සභා සම්මත කරන ලදි :—

| ඉදිරි මුදල් | රු. | ශ. | වැඩිපුර මුදල් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ 1 ඒ—වැටුප්—ලේකම් ... ... ... | 100 | 0 | ඒ 2 ඊ— අධිකරණ ගාස්තු ... ... | 300 | 0 |
| ඒ 1 සී—වැටුප්—ආදයම් ඕවර්සියර් ... ... | 60 | 0 | ඒ 2 එම්—ටැලිපෝන් ගාස්තු ... ... | 100 | 0 |
| ඒ 1 ඩී—වැටුප්—කාර්යාල කායර්‍ය සහායක ... ... | 35 | 0 | ඩී 1 කේ—කිරි පරීක්ෂා කිරීම ... | 25 | 0 |
| ඒ 2 බී—ගමන් වියදම් ... ... ... | 400 | 0 | ඩී 3 බී— වැසිකිළි ශෝධනය කරත්ත ගොන් සහ ලොරි ... | 200 | 0 |
| ඒ 2 ජී—වාහන කහඩු ... ... ... | 15 | 0 | ඩී 4 බී— ගවමඩු නඩත්තු කිරීම ... ... | 300 | 0 |
| ඒ 2 එන්—බැංකු බදු ... ... ... | 60 | 0 | | | |
| ඒ 3— ආපසු ගෙවීම් ... ... ... | 80 | 0 | | | |
| ඒ 5— නොමිලේ පොත් බෙදදීම ... ... | 60 | 0 | | | |
| ඩී 5 ඒ—වැටුප්—ජලය සැපයීම ... ... | 15 | 0 | | | |
| ඊ 7— විනෝද බදු පරීක්ෂා කිරීම ... ... | 100 | 0 | | | |
| | 925 | 0 | | 925 | 0 |

සභාපති වෙනුවට.

1966.10.10 වැනි දින,
ලුණුගල සුළු නගර සභා කායර්‍යාලයයේදී.

අනුමත කරන ලදි.

ඇම්. බී. සමරකෝන්,
ඌවේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1966 ඔක්තෝබර් 30 දින,
බදුල්ලේ දී ය.

11–491—66.11. 10දින අංක 14,721 දරණ ගැසට් පත්‍රය

---

## මුල්ලේරියාව සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රයයි.**

| මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ | රු. | ශ. | මුදල් මදිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| බී.—මංමාවත්— | | | ඒ.—සාමාන්‍ය වියදම්— | | |
| 2. නඩත්තු කිරීම | 700 | 0 | 4. ආධාර සහ පරිත්‍යාග | 700 | 0 |

සුළු නගර සභා කායර්‍යාලය,
මුල්ලේරියාව.

කේ. ඒ. ඩී. කරුණාරත්න,
සභාපති.

අනුමත කරමි.

පී. කේ. දිසානායක,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
(බටහිර කොටස).

සහකාර පළාත් පාලන කායර්‍යාලය,
නො. 8, බම්බලපිටිය ඩ්‍රයිව්,
බම්බලපිටිය.
1966.10.26 වෙනි දින,

11–476—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

**මුදල් රෙගුලාසි අංක 12 (II) යටතේ කෙරෙන අයදුම් පතයි**

**1966 අය–වැය ලේඛනය**

1966 අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1966 ක්වූ ඔක්තෝම්බර් මස 27 වෙනි දින පවත්වන ලද අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවේ මාසික රැස්වීමේදී අංක 10 දරණ සභා තීරණයෙන් සම්මත වී තිබේ.

| 1966 අයවැය ලේඛනයේ වෙන්කර තිබෙන මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද ශීර්ෂයන් හා මුදල් | රු. | ශ. | අතිරේක වැය අවශ්‍යවී තිබෙන ශීර්ෂයන් හා මුදල් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| බී.—මංමාවත් :— | | | බී.—මංමාවත් :— | | |
| (8) සංවර්ධනය ... | 1,500 | 0 | (12) අළුත් වැඩ ... | 1,500 | 0 |

| 1966 අයවැය ලේඛනයේ වෙන්කර තිබෙන මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද ශීර්ෂයන් හා මුදල් | රු. | ශ. | අතිරේක වැය අවශ්‍යවී තිබෙන ශීර්ෂයන් හා මුදල් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| 1. සාමාන්‍ය— | | | ඊ.—මහජන සෞඛ්‍ය :— | | |
| (ජේ) කිරි පරීක්ෂක ගාස්තු | 100 | 0 | (7) වෙළඳ පලවල් සහ ගාල් | — | |
| (කේ) වසංගත රෝග මර්ධන කටයුතු | 100 | 0 | (බී) නඩත්තුව ... | 400 | 0 |
| (ඇන්) කාණු නඩත්තු කිරීම | 100 | 0 | | | |
| (ඕ) ක්ෂය රෝග මර්ධන කටයුතු | 100 | 0 | | | |
| | 1,900 | 0 | | 1,900 | 0 |

විජේමුනි සුසිරිපාල සොයිසා.
සභාපති.

පළාත් ආණ්ඩු සභා කායර්‍යාලය,
අවිස්සාවේල්ල,
1966 ඔක්තෝම්බර් මස 30 වැනි දින.

11–457/1—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### 1966 වර්ෂයේ දෙවන පරිපූරක අය–වැය ලේඛනය

| වැය ශීර්ෂය | ගණන රු. ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (2) කාර්‍ය මණ්ඩලීය වියදම්— | | |
| (ඒ) අමතර දීමනා ... ... ... | 120 0 ... | 1966.10.27 අංක 10 |
| (ඇජ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රසිද්ධ කිරීම් හා කාර්‍යාලීය කටයුතු ... | 7,000 0 ... | එම |
| (ඇල්) අතිකාල දීමනා ... ... ... | 120 0 ... | එම |
| බී.—මංමාවත් :— | | |
| (2) නඩත්තුව ... ... ... ... | 70 0 ... | එම |
| (13) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... ... | 200 0 ... | එම |
| සී.—තානායම් :— | | |
| (2) නඩත්තුව ... ... ... ... | 700 0 ... | එම |
| ඊ.—මහජන සෞඛ්‍ය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ඇම්) මාතෘ නිවාසය හා දරකාභිවෘද්ධි චිකිත්සාගාරය ... | 300 0 ... | එම |
| (2) කුණු කසල බැහැරලීම— | | |
| (බී) කරත්ත ගොනුන් සහ ලොරි ... ... | 600 0 ... | එම |
| (4) ගවඝාතක මඩුව සහ ගවගාල— | | |
| (බී) නඩත්තුව ... ... ... | 260 0 ... | එම |
| (5) ජල සම්පාදනය— | | |
| (සී) නඩත්තුව ... ... ... | 200 0 ... | එම |
| (7) වෙළඳ පොලවල් සහ ගාල්— | | |
| (බී) නඩත්තුව ... ... ... | 555 0 ... | එම |
| (එච්) ජීවනාධාර විශේෂ ජී. ආධාර ... ... | 75 0 ... | එම |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව :— | | |
| (1) විදුලි බලය නිෂ්පාදනය— | | |
| (ඩී) විදුලි බලය මිලයට ගැනීම ... ... | 8,100 0 ... | එම |
| ඇම්.—කියවීම්ශාලා සහ පුස්තකාල :— | | |
| (2) පොත් පත් සඟරා ආදිය සඳහා ... ... | 100 0 ... | එම |
| | 18,400 0 | |

වර්ෂ 1966 ක්වූ ඔක්තෝම්බර් මස 27 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී අංක 10 යටතේ ඒකමතිකව සහා සම්මත වී තිබේ.

විජේමුනි සුසිරිපාල සොයිසා,
සභාපති.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
1966 ක්වූ ඔක්තෝම්බර් මස 30 වෙනි දින,
අවිස්සාවේල්ල.
11–457/2—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

## මොනරාගල සුළු නගර සභාව

### නිවරද කිරීමක්

1966.7.22 දින අංක 14,705 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ හතරවැනි කොටසේ 538 වැනි පිටුවේ ප්‍රකාශයට පත් කරන ලද මොනරාගල සුළු නගර සභාවේ මුදල් රෙගුලාසි අංක 40 (11) යටතේ ඉල්ලුම් පත්‍රයෙහි වැඩිපුර යන ශීර්ෂය යටතේ "M සී—(සී) ඉදිකිරීම්" යනුවෙන් දක්වෙන මුද්‍රණදෝෂය "සී 7 (සී) ඉදිකිරීම්" යනුවෙන් නිවරදි විය යුතුය.

ආර්. ජේ. ලෙනොරා,
සභාපති.

1966 ඔක්තෝබර් මස 19 වෙනිදා,
මොනරාගල සුළු නගර සභා කාර්යාලයේදීය.
11–493—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

---

## කුලියාපිටිය නගර සභාව

### 1966 වර්ෂයේ 11 වන පරිපූරක අය වැය ලේඛනය

| ශීර්ෂය | රු. ශ. | දිනය | යෝජනා අංකය |
|---|---|---|---|
| ඞී. 7—නගර සහා ගොඩනැගිලි හා ඉඩම්—අලුත් වැඩ ... ... ... | 40,000 0 ... | 1966.10.26 ... | 12 |
| ඊ. 1ජී—සනීපාරක්ෂාව—වතුර බැස්වීමේ කානු ... ... ... | 6,500 0 ... | 1966.10.26 ... | 12 |
| ඊ. 1ඞී—සනීපාරක්ෂාව—දීමනා ... ... ... | 270 0 .. | 1966.10.26 ... | 12 |
| ජේ. 6—විදුලි බල කාර්‍යාංශය—දීර්ඝ කිරීම හා සංවර්ධන ... ... ... | 34,440 0 ... | 1966.10.26 ... | 12 |
| ඊ. 7ඞී—සනීපාරක්ෂාව—වෙළෙඳ පොළ හා ගාල් ඉදි කිරීම් ... ... | 16,605 0 ... | 1966.10.26 ... | 12 |
| | 97,815 0 | | |

ලයනල් ජයතිලක,
සභාපති.

1966 ඔක්තෝබර් මස 30 වැනි ද,
කුලියාපිටිය නගර සභා කාර්‍යාලයේ දී ය.
11–477/1—66.11.10 දින අංක 14,721 දරන ගැසට් පත්‍රය

ජාතික පුස්තකාල හා ලේඛන මධ්‍යස්ථානය

## කුළියාපිටිය නගර සභාව

